# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | දුරකථන / தொலைபேசி / Telephone: +94 11 2484729 | ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 11 2431498 | ඊ-මේල් / மின்-அஞ்சல் / E-mail | dgto@tod.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number: TOD/REV/R3/02/01 | ඔබේ අංකය / உமது இல / Your Number: | දිනය / திகதி / Date: 2021.11.22 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**2021.12.31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම**

2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් 2020.10.14 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කෙරේ.

02. ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරීන් විසින් මු.රෙ.128(2)(ඈ) විධිවිධාන ප්‍රකාරව තම වගකීම යටතේ පවතින ආදායම් සංකේතාංකවලට අදාලව අර්ධ වාර්ෂිකව හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් /ගණන්දීමේ නිලධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

| ආදායම් සංකේතාංකය | විස්තරය |
|---|---|
| 20.02.01.99 | රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොළිය - අනෙකුත් |
| 20.03.01.00 | විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ |
| 20.03.03.02 | විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම්- අනෙකුත් |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් |

03. එබැවින් ඉහත දැක්වෙන එක් එක් ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද හිඟ ආදායම් සම්බන්ධව ගිණුම් වාර්තා පොත් යනාදිය නිසි පරිදි සංසන්දනය කර රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 ට අදාලව මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් උපදෙස් අනුගමනය කර අමුණා ඇති TOD/REV/01 ආකෘති පත්‍රය අනුව 2021.12.31 දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තා 2022.01.14 දිනට පෙර wijesinghe.krsa@tod.treasury.gov.lk යන විද්‍යුත් ලිපිනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාල දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද එක් එක් වර්ෂයට අදාල හිඟ ආදායමට අනුරූපීව 2021 වර්ෂය තුලදී අයකරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලපරිච්ඡේදය තුළදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අත්හරින ලද එක් එක් ආදායම් වේ නම් ඒ පිළිබඳ විස්තරද අමුණා ඇති TOD/REV/02 ආකෘති පත්‍රයේ සඳහන් කර ඉදිරිපත් කළ යුතුවේ.

05. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2015(V) ප්‍රකාරව ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තරාත්මක වාර්තා සහ පොත්පත් ඔබ විසින් නිසි පරිදි පවත්වා ගත යුතුය.

එච්.සී.ඩී.එල්.සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව